ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2272/51 **-** 2022 මාර්තු මස 25 වැනි සිකුරාදා **- 2022.03.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* ල/ප්‍රාලේ/3/3/5/2/17.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 13/99/FR/380.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :*

මෙහි මහජන කටයුත්තක් යනු නකල්ස් සංරක්ෂණ කලාපය සඳහා රජයට අත්පත් කර ගැනීම වේ.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඊ 385 පිටවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිටවල ගමේ පිහිටි ගෝනමඩවත්ත නමැති ඉඩමේ සර්වේයර් ජනරාල් විසින් 2021.07.22 දිනැතිව පිළියෙළ කරන ලද මු.පි. 1843 හි, කැබලි අංක 01 හි මුළු වර්ගඵලය හෙක්ටයාර් 2.0234 වේ.

**01. කැබලි අංකය 01**

ඉඩමේ නම: ගෝනමඩවත්ත; ඉඩම් පරිහරණය: කැලෑව; හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය: මහනුවර, අස්ගිරිය, දොඩම්වල මාවත, අංක 71/23C ලිපිනයේ පදිංචි රොහාන් නලින් එලිකේවල මයා; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 2.0234.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම්, හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.05.11 වැනි දින පෙ.ව. 10.00 ට ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2022.05.04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතු ය.

එස්. විජයකුමාර්,
ප්‍රාදේශීය ලේකම්,
ලග්ගල.

2022.03.21 වැනි දින,
ලග්ගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0995


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*සැ.යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*